පාතදුම්බර ප්‍රාදේශිය සභාව

මහනුවර දිස්ත්‍රික්කය

-------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අගෝස්තු 27 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය.

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ සභාපතිතුමා, මන්ත්‍රීතුමන්, නිලධාරින් සහ මහජනයා ඇතුළු 16 දෙනෙකු වෙත විකුණන ලද ජල ටැංකි 17 කින් සභාවට අයවිය යුතු රු. 188,320 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) මධ්‍යම පළාත් සභාව මගින් සමාලෝචිත වර්ෂයේදි පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ අංක 32ශ්‍රී 4636 දරන ජීප් රථය හා අංක CPRW 7080 දරන කසල ට්‍රැක්ටරය යන වාහනවල වටිනාකම ගණනයකර ගිණුම්වල දක්වා නොතිබූ බැවින් සභාවේ ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට පරිත්‍යාගයෙන් දායකවීමේ ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා, වටිනාකම රු.31,809,571 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,530,469 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,317,346 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 3,302 | 2,792 | 1,301 |
| (ii) බදු කුලී | 2,418 | 2,857 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,655 | 1,781 | - |
| (iv) වෙනත් ආදායම් | 23,193 | 17,877 | 42,712 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 274,907 |
| (ii) මුද්දර ගාස්තු | 8,510,889 |

### 2.2.3 දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම

2012 නොවැම්බර් 23 දිනැති අංක 1736 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ දැක්වෙන පරිදි දැන්වීම් පුවරු වලට අදාල ගාස්තු අය නොකිරීම හේතුවෙන් සභාවට රු.215,980ක ආදායමක් අහිමි වී තිබුණි.

### 2.2.4 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු

(අ) පරණගම ගම් ප්‍රදේශයේ ස්ථානගත කර තිබූ පුද්ගලික සමාගමකට අයත් සම්ප්‍රේෂණ කුළුණ වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධාන යටතේ ප්‍රකාශිත 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 ගැසට් නිවේදනයට අනුව ගාස්තු අයකර නොතිබුණු බව 2013 මැයි 20 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දි නිරීක්ෂණය විය.

(ආ) බලප්‍රදේශයේ ඇති සම්ප්‍රේෂණ කුළුණු වෙනුවෙන් ගැසට් නිවේදනයේ සදහන් පරිදි අනුකූලතා සහතික ලබා නොගැනිම හේතුවෙන් සභාවට රු.30,000 කට අධික මුදලක් අහිමි වී තිබුණි.

(ඇ) කුළුණු ස්ථාපනය කරන වර්ෂයේ සිට විධිමත් පරිදි ව්‍යාපාර බදු අය කිරිම සහ කුළුණු මගින් සේවා සපයන වෙනත් සමාගම් වලට අදාලව බදු අය කර ගැනීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

2.3 ආර්ථික නොවූ ගනුදෙනු

2012 දෙසැම්බර් 29 දින පවත්වන ලද සභා ගොඩනැගිල්ලේ විවෘත කිරීමේ උත්සවයේ පිරිසිදු කිරීමේ කටයුතු සභා කම්කරුවන් යොදවා සිදු කළ හැකිව තිබුණ ද, ඒ සදහා බාහිර ආයතනයක් වෙත රු.54,134 ක මුදලක් වැය කර, තිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 132 (ඒ) වගන්තිය පරිදි ප්‍රජා පිළිගැනිම සම්බන්ධයෙන් හෝ පොදු වැදගත්කමකින් යුත් යම් සිද්ධි හෝ අවස්ථා පිළිබද උත්සව පැවැත්විමක් හෝ පිළිගැනිමක් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 නොඉක්ම විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ නව සභා කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරිම වෙනුවෙන් අවස්ථා 26 කදි රු.1,519,197 ක මුදලක් සභා අරමුදලින් වියදම් දරා තිබු අතර ඒ සදහා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතියද ලබාගෙන නොතිබුණි.

2.5 අයවැය පාලනය.

පහත සදහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සදහා අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදිත රු. 77,533,300 ක මුළු වියදම ඉක්මවා රු. 2,987,995 ක වියදමක් දරා තිබුණි.

(ආ) අයවැය ලේඛනයේ සදහන් අවස්ථා 53 කට අදාළ වියදම් සදහා ප්‍රතිපාදන කළ රු. 8,949,000 ක මුදලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) අවස්ථා 23 කට අදාළ රු. 5,651,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලින් සියයට 12 ක්වූ රු. 687,399 ක වියදමක් දරා තිබුණ අතර, ඒ අනුව, සියයට 88ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

2.6 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය පරිදි පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව සහා අරමුදලින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 09 ක් සඳහා රු. 900,000 ක අත්තිකාරම් මුදලක් ප්‍රජා සංවර්ධන සමිති 5 කට ගෙවා තිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුම් අනුව 2013 ජනවාරි 02 දිනට වැඩ නිම කිරිමට තිබූ මඩවල කොස්වත්ත මාර්ග - II අදියර කර්මාන්ත දෙකෙහි වැඩ 2013 මැයි 31 දින වන විගණන දිනටත් නිමකර නොතිබූ අතර, බාහිර පාර්ශවයක් වෙත ලබා දී තිබූ රු.200,000 ක අත්තිකාරම් මුදල සහා අරමුදලට බැර කරවා ගැනිමට නොහැකිවි තිබුණද නීතිමය ක්‍රියාමාර්ග වෙත යොමු වි තිබුණි.

(ඇ) කර්මාන්ත 13 ක් සඳහා මාර්ගවල අතුරන ලද කොන්ක්‍රිට් කුට්ටි සඳහා සම්පිඩන ශක්ති වාර්තා ලබා ගෙන නොතිබූ අතර, ඉන් කර්මාන්ත 07 ක් සඳහා සම්පීඩන ශක්ති වාර්තා ලබා ගැනීම වෙනුවෙන් රු.70,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) සම්පිණ්ඩන ශක්තිය 25N/M $^{M2}$ ට අඩු කුට්ටි ගල් මාර්ග 6 කට අතුරා තිබූ අතර, ඉන් කර්මාන්ත 04 ක් සඳහා රු.2,000,000 මුදලක් ගෙවා තිබුණි.

(ඉ) සම්පිඩන ශක්තිය පරික්ෂා කිරිම සිදු කර තිබුණේ මුළු ව්‍යාපෘතියෙන් සියයට 0.2 ක් වන අතර, එහි ප්‍රතිශතයෙන් සියයට 10 සිට සියයට 85 දක්වා ප්‍රතිශතයක කුට්ටිගල්වල සම්පීඩන ශක්තිය නියමිත ප්‍රමාණයට වඩා අඩු බැවින් කර්මාන්ත වල පැවැත්ම පිළිබඳ විගණනයේදි සෑහිමකට පත්විය නොහැකි බව නිරීක්ෂණය විය.

(ඊ) ගම්මන්තලාව විහාරස්ථානය අසලින් සිගහවතුර මාර්ගයට කුට්ටිගල් ඇතිරිම් ව්‍යාපෘතිය පිළිබඳ කාර්මික නිලධාරින් සමග 2013 මැයි 20 දින සිදුකරන ලද භෞතික පරික්ෂාවේදි මාර්ගයේ අඩි 15 ක් පමණ ප්‍රමාණයක් ප්‍රමිතියට අනුකුලව කුට්ටි ගල් අතුරා නොතිබූ බව අනාවරණය විය.

(උ) ගිවිසුම ප්‍රකාරව නියමිත දින දි ව්‍යාපෘතිය නිම නොකිරිම හේතුවෙන් කර්මාන්ත 5 කට අදාළව රු. 64,750 ක ප්‍රමාද දඩ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9 වගන්තිය පරිදි ප්‍රජා සංවිධාන අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සමිති විය යුතු අතර ප්‍රාදේශිය ලේකම්වරයා විසින් එම සංවිධානවල මුල්‍යමය හැකියාවද තහවුරු කර තිබිය යුතුය. ගම

නැගුම ව්‍යාපෘති කර්මාන්ත 42 ක් සඳහා ටෙන්ඩර් කැඳවීම් කර නොතිබුණි. ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ප්‍රජා සංවිධානවල ඉල්ලීම මත සහ කර්මාන්ත ඉටු කිරීමේ මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් බව ප්‍රජා සංවිධාන සභාවට දැන්වීමෙන් අනතුරුව සභාපතිවරයා අනුමත කිරීමෙන් පමණක් කොන්ත්‍රාත්තු පවරා දී තිබුණි.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

2004 වර්ෂයේ සිට නවයාලතැන්න පළාත් පාලන පුහුණු මධ්‍යස්ථානයේ පූර්ණ කාලීනව සේවය කරනු ලබන සභාවේ නිලධාරියෙකුට 2013 මැයි දක්වා වැටුප් වශයෙන් රු.1,731,750 ක මුදලක් සභාව විසින් ගෙවා තිබු අතර, එම මුදල පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ණයගැති, ණයහිමි පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය